# ගනේගොඩැල්ල පුරාණ විහාරයේ ඓතිහාසිකත්වය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**දිලාන් කේ.ටී.එස්.**[1]

ගනේගොඩැල්ල පුරාණ විහාරය බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයට අයත් වන අතර අගලවත්ත මැතිවරණ කොට්ඨාශයෙහි පිහිටා ඇත. මෙම පුරාණ විහාරස්ථානය අයත් වන්නේ 833 කිතුල්ගොඩ ග්‍රාම නිලධාරී වසමට යි. කොළඹ සිට මතුගම හරහා අගලවත්ත නගරයට පැමිණ, අගලවත්ත පැල්වත්ත මාර්ගයේ සැතපුම් 5 ක් පමණ ගමන් කරන විට වම් පසින් මහා මාර්ගය අසල ම විහාරස්ථානය හමුවේ. මහනුවර යුගයේ සිතුවම් හා මූර්ති සම්ප්‍රදායට සමානකම් දක්වන සිතුවම් හා මූර්ති මෙහි දැකිය හැක. විහාර භූමියේ පුරාවිද්‍යාත්මක විශේෂතා මොනවා ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. එහි පුරාවිද්‍යාත්මක නටඹුන් මඟින් හෙළිවන ඓතිහාසිකත්වය විමර්ශනය කිරීම හා මෙම භූමිය සංරක්ෂණය සඳහා පෙළඹවීම යන අරමුණ යටතේ මෙම අධ්‍යනය සිදු කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනයෙහි නිරත වෙමින් කලින් කලට එම විහාරයේ වැඩ සිටි හිමිවරුන් හා වත්මන් භාරකාරීත්වය සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින් දත්ත ඒකරාශී කරන ලදී. මෙම විහාරය ප්‍රතිරාජ නම් රාජ අමාත්‍යවරයෙකුගේ මූලිකත්වයෙන් ආරම්භ වූවක් බව ජනවහරේ එකී වත්මන් විහාරාධිපති ගරු පූජ්‍ය ඕවිටිගල විලධම්ම ස්වාමීන් වහන්සේ ය. මෙම විහාරයේ ටැම්ලිපියක් දක්නට ලැබෙන අතර පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථානයන් එයට හිමි වේ. මෙය කිතුල්ගොඩ ටැම් ලිපිය ලෙස හඳුන්වයි. මෙම ටැම් ලිපියෙහි උඩ කොටස අස්ථානගත වී ඇත. එහෙත් එයින් ඓතිහාසික තොරතුරු රැසක් අනාවරණය කර ගැනීමට හැකි විය. මෙම ටැම් ලිපියට අනුව පහතරට සහ පරපුර බිහිවන්නේ වේහැල්ලේ ධම්මදින්න වැවගම ඉන්දසාර යන යතිවරුන්ගේ පරම්පරාවෙන් බව යි. උන්වහනේස්ලා ශිෂ්‍යවරයන් වහන්සේලා විසින් වනගත ව තිබූ බෙන්තර ගලපාත විහාර එළිපෙහෙලිකොට ප්‍රතිසංස්කරණය කොට අනතුරුව බෝධිමළුව හා වනවාසයද මතු කරවාගෙන උගත් සඟ පරපුරක් ඇති කර බව මෙහි සඳහන් වේ. කිසිඳු සංරක්ෂණ කටයුත්තක් මෑත කාලයේ දී සිදු නොවීම හේතුවෙන් මෙම පුරාවිද්‍යාත්මක සාධක ස්වාභාවික ලෙස විනාශවෙමින් පවතී. විහාරස්ථානය අවට සිටින වැඩිහිටියන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා මඟින් විහාරස්ථානයේ හි ඇති වැදගත් පුරාවිද්‍යාත්මක සාධකයන් පිළිබඳව දැනුවත් වීමට මෙයින් අවස්ථාව උදා විය. මෙම විහාරය නුවර යුගයේ දී විහාරස්ථානයක් බවට පත් වූ ආකාරය පිළිබඳව ද විවිධ තොරතුරු සොයා ගැනීමට හැකි විය. ගනේගොඩැල්ල විහාරස්ථානයේ පවතින බෙහෙත් ගල මඟින් ද කියැවෙන්නේ එකී ඓතිහාසික සාධකයි.

**මුඛ්‍ය පද :** ටැම්ලිපි, වනවාස, සංරක්ෂණය

---

[1]ආර්ථිකවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. sdilan071@gmail.com